ඉල්ලුම් පත්‍රය සම්පූර්ණ කිරීම සඳහා උපදෙස්

01. 1.1 අංක 03 (01) 2009 හා 2011.03.01 දිනැති සංශෝධිත චක්‍රලේඛයෙහි උපදෙස් අනුගමනය කළ යුතු ය.

1.2 පහත සඳහන් සුදුසුකම් සපුරාලන දනට අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ සේවයේ නියුතු අයට මේ සඳහා ඉල්ලුම් කළ හැකි ය.

(අ) ප්‍රාථමික ගුරු පුහුණු/ විද්‍යාපීඨ ප්‍රාථමික පුහුණු/ උපාධි සහිත පාසලක 3 වන ශ්‍රේණියේ සිට 5 වන ශ්‍රේණිය දක්වා ඇති පන්තියක සේවය කරන අවු. 3ට වැඩි සේවා කාලයක් සහිත ගුරුවරයකු වීම.

(ආ) වෙනත් නිලධාරියකු නම් දනට ප්‍රාථමික විෂය නිර්දේශයට අදාළ අධ්‍යාපනික උපදේශන හෝ ඊට සමාන කටයුතුවල නිරත වීම

1.3 අංක 09 සම්පූර්ණ කිරීමේ දී පාඨමාලාව සටහන් කිරීම අනිවාර්ය වේ. උදා: ප්‍රාථමික/විද්‍යා/ගණිත ආදී ලෙස

1.4 මෙහි අංක 12 සහ 13 ඡේද සම්පූර්ණ කිරීමේ දී "ඔව්" හෝ "නැති" යන්න පැහැදිලිව (√) ලකුණකින් සටහන් කරන්න. එසේ සම්පූර්ණ නොකරන ලද ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

* දනට ඔබට විරුද්ධව විනයානුකූල පරීක්ෂණයක් පැවැත්වේ නම් හෝ ඔබ විභාග තහනමකට ලක්වූවකු නම් හෝ ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කළ නොහැකි ය.

1.5 පවුලේ සාමාජිකයකු යනුවෙන් අදහස් කරන්නේ ඔබගේ දරුවන් හෝ දරුවන්ගේ දරුවන් හෝ ඔබගේ හෝ කලත්‍රයාගේ සොයුරු සොයුරියන් හෝ ඔවුන්ගේ දරුවන් හෝ දරුවන්ගේ දරුවන් හෝ වේ.

1.6 ගුරුවරුන්ගේ ඉල්ලුම් පත්‍ර මාර්ගගත ක්‍රමයට **(Online)** විදුහල්පති විසින් නිර්දේශ කර මාර්ගගත ක්‍රමයට **(Online)** මෙම දෙපාර්තමේන්තුවට එවිය යුතුයි.

1.7 පූර්වෝක්ත විභාගයේ උත්තරපත්‍ර ඇගයීම් මධ්‍යස්ථාන පහත දක්වා ඇති නගරවල පිහිටුවීමට යෝජිත ය.

| | | | |
|---|---|---|---|
| 01. කොළඹ | 20. බදුල්ල | 33. හලාවත | 47. අම්පාර |
| 02. මහරගම | 22. මහියංගනය | 35. අනුරාධපුරය | 48. කල්මුණේ |
| 07. අවිස්සාවේල්ල | 23. අම්බලන්ගොඩ | 36. පොළොන්නරුව | 50. මඩකලපුව |
| 08. හොරණ | 24. ඇල්පිටිය | 37. ත්‍රිකුණාමලය | 51. වවුනියාව |
| 10. කළුතර | 25. ගාල්ල | 38. කෑගල්ල | 53. යාපනය |
| 12. මීගමුව | 26. අකුරැස්ස | 39. පේරාදෙණිය | 54. නෙල්ලිඅඩි |
| 13. ගම්පහ | 27. මාතර | 41. මහනුවර | 55. කිලිනොච්චිය |
| 14. නිට්ටඹුව | 28. තංගල්ල | 42. මාතලේ | 56. පුත්තලම |
| 15. රත්නපුරය | 30. කුරුණෑගල | 44. නුවරඑළිය | 57. දඹුල්ල |
| 17. ඇඹිලිපිටිය | 31. නිකවැරටිය | 45. හැටන් | |
| 19. බණ්ඩාරවෙල | 32. කුලියාපිටිය | 46. මොනරාගල | |

**සැ.යු. ප්‍රමාණවත් ඉල්ලුම්පත්‍ර සංඛ්‍යාවක් නොලැබෙන නගරවල ඇගයීම් මධ්‍යස්ථාන පිහිටුවනු නොලැබේ. එබැවින් දෙවන කැමැත්ත ද සඳහන් කළ යුතු ය.**

1.8 පත්වීම දෙනු ලබන්නේ පෞද්ගලික හෝ රාජකාරි ලිපිනයට ආසන්න ම ඇගයීම් මධ්‍යස්ථානයට ය. එම මධ්‍යස්ථානයේ අදාළ පත්‍රයේ ඇගයීම් මණ්ඩල නොමැති නම් හෝ ප්‍රමාණවත් පුරප්පාඩු සංඛ්‍යාවක් නොතිබේ නම් හෝ වෙනත් ආසන්න ඇගයීම් මධ්‍යස්ථානයකට යොමු කෙරේ.

1.9 මෙම ආකෘතිය සම්පූර්ණ කර (15 ඡේදය හැර) විදුහල්පතිට/ ආයතන ප්‍රධානියාට භාර දෙන්න.

02. සහතික කරන නිලධාරියා

ගුරුවරුන්ගේ අයදුම්පත් විදුහල්පති විසින් ද, ගුරු උපදේශකවරුන් කලාප නම්, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් ද කොට්ඨාස නම් කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් ද සහතික කළ යුතු ය.

03. සහතික කරන නිලධාරියාට උපදෙස්

3.1 අයදුම්කරු මෙම ආකෘතියේ සඳහන් කරන ලද තොරතුරු නිවැරදිදැයි පරීක්ෂාකාරීව කියවා බලන්න.

3.2 ඉහත සඳහන් තොරතුරු නිවැරදි බව 3 වන පිටුවේ අදාළ ස්ථානයෙහි අනිවාර්යයෙන් ම සහතික කරන්න.

3.3 ඉහත අංක 15 (a) (i) සිට (iv) දක්වා ඇති කරුණු යටතේ අයදුම්කරු පිළිබඳ ව ඔබේ තක්සේරුව අදාළ කොටුව තුළ නියමිත අක්ෂරය සටහන් කිරීමෙන් දක්වන්න.

A - විශිෂ්ටයි  B - හොඳයි  C - සාමාන්‍යයි  W - දුර්වලයි

මෙය රහස්‍ය වාර්තාවකි. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍ර සහතික කිරීමෙන් පසු උපලේඛනගත කර අදාළ ඇමුණුම් ද සහිතව තම කාර්යාලයේ සුරක්ෂිතව තබාගත යුතුය.

නවක අයදුම්කරුවන්ගේ සහ පාසල් ගුරුවරුන් නොවන සියලුම අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත්‍ර ඇමුණුම් (අදාල සහතිකවල සහතික කරන ලද පිටපත්) ද සහිතව, ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ ''උත්තරපත්‍ර පරීක්ෂකවරුන් තෝරා ගැනීම සඳහා අයදුම්පත්‍ර, 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය - 2023'' ලෙස සඳහන් කර පහත ලිපිනයට යොමු කරන්න.

**සියලුම අයදුම්පත්‍ර භාර ගැනීමේ අවසන් දිනය 2023.09.01 බව සලකන්න.**

විභාග කොමසාරිස් ජනරාල්
පාසල් විභාග (ඇගයීම්) ශාඛාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
තැ.පෙ. 1503,
කොළඹ.

**සැ.යු. නිවැරදි තොරතුරු ඉදිරිපත් නොකිරීම තුළින් ඔබට ඇගයීම් කටයුතු සඳහා අවස්ථාව නොලැබී යා හැක. එබැවින් තම තොරතුරු ඉතා නිවැරදිව පුරවා පරීක්ෂා කිරීමෙන් පසුව යොමු කරන්න.**